# අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ පන්තිවල ක්‍රියාත්මක වන පාසල පදනම් කර ගත් ඇගයීම් ක්‍රියාවලිය තුළ ගුරු කාර්යභාරය හා සිසු සහභාගිත්වය පිළිබඳ විමසා බැලීම

## (ගාල්ල දිස්ත්‍රික්කයේ පාසල් ඇසුරින්)


ජී. එම්. විකුම් ප්‍රියලාල්

වාණිජවේදී විශේෂ (ගෞරව), (කොළඹ විශ්ව විද්‍යාලය)

පශ්චාත් අධ්‍යාපන උපාධි ඩිප්ලෝමා (කොළඹ විශ්ව විද්‍යාලය)

අධ්‍යාපන පති (කොළඹ විශ්ව විද්‍යාලය)

අලෙවි කළමනාකරණ ඩිප්ලෝමා (ජාතික ව්‍යාපාර කළමනාකාරිත්ව ආයතනය)


කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය

2013


UCLIB
567854

M-Phil-18/ (2004-2006)

Class No:
Acc. No: 567854

# සංක්ෂේපය

ජාතික අධ්‍යාපන ක්‍රමයේ මූලික අරමුණ වන්නේ ඉගෙනුමට සම්බන්ධ සෑම දරුවෙකුම අපේක්ෂිත සාධන මට්ටමකට ගෙන ඒම වුවද ශ්‍රී ලංකාවේ මේ දක්වාම සිදුව ඇත්තේ අධ්‍යාපන ක්‍රියාවලිය මගින් සිසුන් කිහිප දෙනෙකුට පමණක් දැනුම අත්පත් කරදීම සහ විභාග සමත් කර දීමට අවශ්‍ය ප්‍රජානන කුසලතා වර්ධනය සඳහා ගුරු සහාය ලබාදීම බව මේ සම්බන්ධව කළ පර්යේෂණ වලින් අනාවරණය වී ඇත.

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති හා සැලසුම් වල වෙනස්වීම මත ජාතික අධ්‍යාපන ක්‍රමයේද සාජු වෙනස්කම් කාලයෙන් කාලයට සිදුවූ අතර රට ගැලපෙන අයුරින් ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රමවේද වෙනස් කරමින් ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික විභාග ක්‍රමය වෙනුවට නොයෙක් ඇගයීම් ක්‍රමද හඳුන්වා දී ඇත. මේ අතර පාසල් පදනම් කරගත් ඇගයීම් ක්‍රමය අ.පො.ස. උසස් පෙළ විභාගය සඳහා ඉදිරිපත් වන සිසුන් වෙනුවෙන් 2003 වර්ෂයේ සිට හඳුන්වා දුනි. මෙය උසස් පෙළ ගුරුභවතුන් වෙත පැවරුණ අතිරේක කාර්යයක් වූ අතර විභාග දෙපාර්තමේන්තුව රට මැදිහත් වීමත් සමගම එහි කාර්යයේ විධිමත් බවක් හා නීත්‍යානුකූල බවක් ඇති වී තිබේ. ඒ අනුව උසස්පෙළ SBA ඇගයීම් වල අරමුණු හා එම අරමුණු ඉටුකරගැනීමේ යෝජිත ක්‍රමවේද කවරේද, SBA වලදී ගුරු කාර්යභාරය හා එය කොතෙක් දුරට ඉටුකරනු ලැබ ඇත්ද, SBA සඳහා සිසුන්ගේ සහභාගීත්ව මට්ටම කවරේද ?, SBA ඇගයීම් වල ගුරු ආකල්ප පිලිබඳව විමසා බැලීම මෙහි මූලික අරමුණු වනු ඇත.

ශ්‍රී ලංකාවේ උසස්පෙළ ඇති සියළුම පාසල් ද එහි ඉගැන්වීමේ යෙදෙන ගුරුභවතුන් ද, ඉගෙනුම ලබන සිසුන් ද, අධ්‍යයනයේ ජනගහනය වන අතර ඉන් ළඟාවිය හැකි ජනගහනය වන ගාල්ල දිස්ත්‍රික්කයේ උසස් පෙළ ඇති පාසල් සහ එහි ගුරුවරුද, සිසුන්ද අතරින් 1 AB ජාතික පාසල් 05 ක්ද, 1 AB ජාතික නොවන පාසල් 03 ක් ද 1 C පාසල් 17 ක්ද වශයෙන් පාසල් 25 ක් ද, එම පාසල් වල විද්‍යා, වාණිජ, කලා යන විෂයන් උගන්වනු ලබන ගුරුවරුන් 116 ක්ද, සිසුන් 231 ක්ද, යන නියැදිය අහඹු නියැදි ක්‍රමය යටතේ ස්ථරායන අහඹු නියැදි ක්‍රම ශිල්පය අනුව තෝරා ලෙස විස්තරාත්මක පර්යේෂණ ක්‍රම ශිල්පය අනුව නියැදි සමීක්ෂණය ක්‍රමයද යොදාගනිමින් අධ්‍යයනය සිදුකෙරිණි.

දත්ත රැස් කිරීම සඳහා ගුරු සිසු ප්‍රශ්නාවලිද, අනෙකුත් පාර්ශව සම්මුඛ සාකච්ඡා ක්‍රමයද, යොදාගෙන රැස් කළ දත්ත ගුණාත්මක ප්‍රවේශ භාවිත කරමින් විශ්ලේෂණය කෙරිණි. එහෙත් අවැසි තැන්වලදී ප්‍රමාණාත්මක ප්‍රවේශය මගින් සංඛ්‍යාන ව්‍යාප්ත වගු, ප්‍රතිශත හා ප්‍රස්තාර විශ්ලේෂණ සඳහා යොදා ගත් අතර සාහිත්‍ය විමර්ශනයෙන් ද, අදාළ ග්‍රන්ථ පරිශීලනයෙන්ද, චක්‍රලේඛ, අත්පොත් වැනි ආදියෙන්ද තොරතුරු රැස් කෙරිණි.

හිතකර මානසික පරිසරයක් SBA තුළින් නිර්මාණය වී ඇති බවත්, සම්ප්‍රදායික විභාග ක්‍රමයෙන් මැනීමට අපහසු උසස් මානසික බලවේග හා හැකියා මෙම ඇගයීම් ක්‍රමය මගින් මැනිය හැකි බවත්, සම්භවන හා සම්පිණ්ඩිත යන ඇගයීම් දෙවර්ගයෙහි සංකලනයක් වන බවත්, ඇගයීම් ක්‍රියාත්මක

කිරීමේදී පාසලේ විදුහල්පතිවරයා ඇතුළු ඇගයීම් නියාමන කමිටුවල සක්‍රීය දායකත්වය මගින් සාජු නියාමන හා අධීක්ෂණ කටයුතු ඉතා වැදගත් වන බවත් පාසල් වර්ග අතරින් SBA වලදී නිර්මාණශීලී හා ක්‍රියාශීලී කර්තෘවයක යෙදී ඇත්තේ 1 AB ජාතික පාසල්වල ගුරුභවතුන් බවත්, නිගමනය කෙරුණි.

නියමිත කාලයට ඇගයීම් ඇරඹීම, නිවැරදිව සම්පූර්ණ කිරීම, අන් අයගේ ආධාරයක් ඇතිව ඇගයීම් සඳහා යොමු වී තිබීම ආදිය මෙම ඇගයීම් ක්‍රමයේ ප්‍රබලතා ලෙස හඳුනාගෙන ඇති අතර එය 1990 සැමට අධ්‍යාපනය නම් ජොම්තියන් සමුළු ප්‍රකාශනයේ අනාවරණ 04 න් අවසාන අනාවරණ සාධකය වූ ඇගයීම් ක්‍රමය සඳහා ප්‍රජානන, මනෝචාලක හා අවේදනික යන කොටස් සියල්ලම පදනම් විය යුතුය යන්න මෙම අධ්‍යයනයෙන් ද වඩාත් තහවුරු විය. එසේම මෙම ඇගයීම් ක්‍රියාත්මක කිරීමේදී ඇති වූ දුර්වලතා අතර පන්ති කාමර කලමනාකරණ ගැටළු, විෂය හා විෂය නිර්දේශ ගැටළු, ගුරු කාර්ය වෙනස් වීමේ ගැටළු, ඇගයීම් තොරතුරු සන්නිවේදනය කිරීමේ හා වාර්තා තබාගැනීමේ ගැටළු ප්‍රධාන වේ.

එසේම SBA ඇගයීම් නිසා ගුරුවරු ග්‍රන්ථ පරිශීලනයට යොමු වීමේදී ඇගයීම් කමිටු නියෝජිතයන්ගේ මැදිහත් වීමේ හා නියාමනය හා අධීක්ෂණයේද අඩු බවත්, විභාග කේන්ද්‍රීයව කටයුතු කිරීම නිසා SBA ඇගයීම්වල යෙදීමට ඇති කාලයේ සීමාව ද, විෂය නිර්දේශ සම්පූර්ණ කිරීමට වෙහෙසීම නිසා ඇගයීම් සඳහා කාලය යෙදවීමේ සීමාව ද, උසස් පෙළ ගුරුවරුන් වෙත ඇගයීම් පිළිබඳ දැනුවත් කිරීමේ දුර්වලතා ද, පුහුණු වැඩසටහන්වලට යොමු වීමේ නොහැකියාව ද, ආදර්ශ ඇගයීම් උපකරණ යොදාගැනීම මගින් අත්කර ගත හැකි සාජු අත්දැකීම් වල සීමාව ද, විභාග දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම, විනා ගුණාත්මක ඇගයීම් කාර්යයේ නොයෙදීමද, මෙහි දුර්වලතා විය.

උසස් පෙළ SBA ඇගයීම් පිළිබඳ ආකල්ප, ඇගයීම් වල කාර්යභාරය පිළිබඳ ආකල්ප, SBA ක්‍රියාත්මක වන ආකාරය ඇගයීම් තුළින් ගුරු සිසු සම්බන්ධතා පිළිබඳ ආකල්ප උසස් පෙළ ඇගයීම් වශයෙන් ප්‍රධාන කොටස් 04 ක් යටතේ ආකල්ප 20 ක් සලකා බැලූ අතර, ඉන් 16 කින් පාසල් වර්ගය හා එම ආකල්ප අතර සම්බන්ධතාවක් ඇතිබවත්, 04 කින් සම්බන්ධතාවයක් නැති බවත් අනාවරණය විය. එසේ 15 කින් විෂය ධාරාව හා ආකල්ප අතර සම්බන්ධතාවක් ඇතිබවත්, 05 කින් සම්බන්ධතාවක් නැති බවත් අනාවරණය විය.

අධ්‍යයනයේ SBA ඇගයීම් පිළිබඳ අඛණ්ඩ පුහුණුවක් ලබාදීම සඳහා නිත්‍ය ක්‍රමයක් සැකසීම, ඒ සඳහා පුහුණුව ලත් සම්පත් පුද්ගලයන් හා ආයතන යොදාගැනීම, ඇගයීම් සඳහා නිපුණතා පාදක වූ ලිහිල් ක්‍රම භාවිත කිරීම, ගුරුවරුන් තුළ මෙම ඇගයීම් පිළිබඳ ධනාත්මක ආකල්ප වර්ධනය කිරීම සඳහා ස්ථිර ක්‍රමවේදයක් සැකසීම, ගුරු ඇගයීම් සඳහා අභිප්‍රේරණ ක්‍රමවේදයක් යොදාගැනීම, ඇගයීම් කාර්යයේ සංකීර්ණ බව අඩු කිරීම හා නියාමන කමිටු සක්‍රීය කොට වගකීම් පැවරීම හා ක්‍රියාත්මක කිරීමේ විධිමත් බවක් ඇතිකිරීමේ සමෝධානිත වැඩපිළිවෙලක් ඇති කිරීම ප්‍රධාන වේ. පොදුවේ නිසි සම්පත් බෙදී යාමක් ඇතිවන පරිදි අධ්‍යාපන ප්‍රතිපත්ති සැලසුම් කිරීමෙන් සාර්ථක SBA ඇගයීම් ක්‍රමයක් හා අධ්‍යාපනයේ ඉගෙනුම්, ඉගැන්වීම් සහ ඇගයීම් යන ත්‍රිවිධාකාර යාන්ත්‍රණය නිසිලෙස ක්‍රියාත්මක කළ හැකිබව අධ්‍යයනයෙන් අවබෝධ විය.

## ABSTRACT

**A STUDY ON THE ROLE OF THE TEACHERS AND PARTCIPATION OF STUDENTS ON THE PROCESS OF SCHOOL BASED ASSESSMENT IN GENERAL CERTIFICATE OF EDUCATION ADVANCED LEVEL CLASSES**

**(In schools of Galle District)**

Researches have revealed that what has so far happened in Education Process in Sri Lanka is that it has enabled only a few students to acquire knowledge and development of cognitive skills with the assistance of teachers, required to get through the relevant examinations although the basic objective of our National Education system is to bring every student to the expected standard of performance.

Remarkable changes have been effected in the National Education system from time to time changing the requisite teaching techniques and introducing various methods of assessments to the traditional examination system of Sri Lanka. One of such methods is the School Based Assessments, introduced for G.C.E (Advanced Level) students in 2003, which method has, however, been an additional burdon on the teachers who teach the students of advanced Level Classes. SBA has been given a formal and legal outlook with the intervention of the Department of Examination with it. It's for this reason that attention was paid on the study of the role of teachers and participation of student in this system of SBA in Advanced Level Classes. Accordingly, the basic of objectives of this study are to examine the objects of SBA, the proposed methods adopted in achieving its target, the role of the teacher in SBA, how far it has been fulfilled, the percentage of participation of students in it, and the attitudes of teachers towards it ultimately.

The research was conducted in terms of Random Survey as provided in Descriptive Research methodology on 231 students, 116 teachers who teach science, commerce and arts at 25 schools constituting seventeen 1 C grade schools, three 1 AB Non – national schools, and five 1AB National schools in Galle District. As the entire population of Advanced Level Students, teachers, engaged in teaching in Advanced Level classes and schools with advanced Level classes are practically unaffordable only above-mentioned population in Galle Distict was teken as affordable population

representing the entire population of Sri Lanka. The above selection was make as stated in stratified random smapling system under random – sampling methodology

Collection of data was done by questionnaires provided with both teachers and students and interviewing of other relevant parties. Then such collected data were processed and analysed by adoption of Qualitative approaches. Quantitative approach was used whenever necessary by using percentage of statistical graphs and analysis of graphs whereas facts were gathered from literal review, studying of requisite texts, relevant circulars and teachers' guides.

It has been revealed from the findings of above-mentioned survey that SBA has created a favourable mental environment in which high mental qualities and skills of students could be determined. It has also revealed that SBA is a combination of both summative and formative assessment methods and by the active contribution of the school principles and Assessment Monitoring Committees, the direct monitoring activities are very important.

Findings have also indicated that only the teachers of 1AB National Schools have played a prominent role in creative and active SBA. The advantages of this assessment method are that Commencement of assessment on time, completion of it correctly, and motivation of students with other's help confirmed the last of four findings of "JOMITHIAN SUMMIT REPORT" entitled "EDUCATION FOR ALL" 1990 which provides that it should be based on cognitive, phycho-motar and Affective elements. The disadvantages of SBA are crises of classroom managements, change of role of teachers, communication of details of Assessment and maintaining records.

Lack of monitoring, supervision and intervention of members of Assessment Monitoring Committees relating to use of text by teachers owing to SBA, Limit of time, allocated for SBA by teachers due to involvement in examination based teaching and non-availability of adequate time on the part of the teachers who are more concerned with completion of syllabus, weaknesses of educating of advanced level teachers, failure on the part of teachers to participate in required training programs insufficiency of direct experience of teachers to be acquired by usage of model assessment requirements, and

non-involvement of teachers in Quantitative assessments are also deemed to be demerits of SBA

Twenty attitudes of four main parts dealing with attitudes of teachers on SBA, its role, attitudes on the rapport between teacher and students through implementation of SBA were also subject to the above research which revealed that there was a relationship between their attitudes and the variety of schools in sixteen instances out of twenty. Fifteen instances of out of twenty indicated that there was a relationship between the stream and attitudes of the teachers.

The main proposals on involvement of SBA are to provide for a regular specific method to train the teachers in this system by employing resource persons and institutes for it, to use quite simplified method for evaluation, to adopt a regular specific methods for enhancements of positive attitudes in teachers on SBA, to adopt motivating methodologies for evaluation of teachers' role in SBA, to reduce complex nature of SBA and set up an eclectic approach for regularity of implementation and assignment of responsibilities after activating Monitoring Committees. The triangular machinery viz. a successful SBA, effective Teaching, Learning and Assessment process can be implemented by careful, far-sighted planning of policies on education assuring proper distribution of resources in common.